# කොටි ඉන්දියාව හා බටහිර රාජ්‍ය

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සාර්ථක ඉන්දීය චාරිකාවක් නිමකළ බවට නිලවාර්තා මෙන් ම නිල නොවන වාර්තා ද ජනතාවට කීමට එකිනෙකා සමග තරග වැදීම කෙසේ වෙතත් ඉන්දියාව තම ස්ථාවරය ඉතා පැහැදිලිව රාජපක්ෂ මහතාට දන්වන්නට ඇත. ඇතැම් සිංහලයන් ඉන්දියාව ගැන විශ්වාසයක් තබා කටයුතුකල ද ඉන්දියාවෙන් සිංහලයන්ට වන යහපතක් නැත. ඉන්දියාවට අවශ්‍යවනුයේ මේ කලාපයේ රටවල් තමන්ට පක්ෂපාතී ආකාරයෙන් තබාගැනීම පමණ ය. ඉන්දියාවට ඇත්තේ ඉන්දියාවේ යහපත යන කරුණ මිස කලාපයේ අනෙක් රටවල සුබසිද්ධිය නො වෙයි. තමන්ගෙන් ස්වාධීන වූ සංස්කෘතියක් ලංකාවේ ගොඩනැගීම පිළිබඳ ව ඉන්දියාව කිසිම දිනක සිංහල බෞද්ධයනට සමාව දෙනු ඇතැයි සිතිය නො හැකි ය. ලංකාවේ ඇත්තේ ඉන්දීය (භාරතීය) මහාසම්ප්‍රදායේ චූල සම්ප්‍රදායක් යැයි කියමින් මෙරට සිටින කසිකබල් උගතුන්ට, භාරතීය සංගීතඥයන්ට ආදීන්ට සතුටු විය හැකි වුවත් ඒ එසේ නොවන බව වෙන කාටත් වඩා හොඳින් ඉන්දියානු උගත්තු දනිති. බටහිර සමාජවිද්‍යාවේ චූල සම්ප්‍රදාය මහා සම්ප්‍රදාය ප්‍රවාදය රෙඩ්ෆීල්ඩ් විද්වතා විසින් නිර්මානයකරනු ලැබුයේ බටහිර නූතනත්වයේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය වත්මන් ලෝකයේ  මහා සම්ප්‍රදාය බවට ඊනියා ශාස්ත්‍රීය මට්ටමකින් තහවුරුකිරීම සඳහා ය.

ඉන්දියාවෙන් නොව කිසිම රටකින්  සිංහලයන්ට, විශේෂයෙන් ම සිංහල බෞද්ධයන්ට, උපකාරයක් බලාපොරොත්තු වියහැකි නො වෙයි. ජාත්‍යන්තර ප්‍රජාව නමින් හැඳින්වෙන බටහිර ක්‍රිස්තියානි රටවල්, හා අද වනවිට මතුපිටින් අඳින කිමෝනාවෙන් තම අභ්‍යන්තර බටහිර සෙළුව වසාගැනීමට තැත්කරන ජපානය කිසිම දිනක සිංහලයන්ට පක්ෂ නොවනු ඇත. අද ජපානය ආර්ථික වශයෙන් යෝධයකු වුව ද සංස්කෘතික වශයෙන් අඟුටුමිට්ටෙකි. ලංකාවේ ද ඇතැමුන් මහා දාර්ශනික සම්පතක් ලෙස දකින මහායාන බුද්ධාගමට ජපානයේ කොරියාවේ හෝ වෙනත් රටකදී හෝ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට දාර්ශනික ව අභියෝගයක් එල්ලකිරීමට නොහැකි වී ඇත. තන්ත්‍රයානයට කිසිම හවුහරණක් නැත්තේ එහි සඳහන් වත්පිළිවෙත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි පදනමෙහි ම ඇති බැවින් ය. අද ඇමරිකා එක්සත් ජනපදවල (මෙහි එක් ජනපදයකට වඩා ඇති බව අමතක නොකළ යුතු ය) මහායාන බුද්ධාගමට තැනක් ඇත්තේ එය ද මොන දාර්ශනික කතා කීව ද අවසානයේ දී ආත්මවාදී වන බැවින් ය. දලයි ලාමා යනු බටහිර මාධ්‍ය විසින් ගොඩනගනු ලැබූ චරිතයකි. දලයිලාමා ජීවත්ව සිටියහොත් බටහිරයන් අවසානයේ දී එතුමා යොදාගනු ඇත්තේ ථෙරවාදයට විරුද්ධව ය. බටහිර රටවලට ඇති ප්‍රධානම සතුරා ආත්මවාදී නොවන ථෙරවාදය බව අමතක නොකළ යුතු ය. බටහිරයන් අද මුස්ලිම් සංස්කෘතියට විරුද්ධව ආක්‍රමණශීලී ව කටයුතුකරන බව පෙනේනට ඇත. එහෙත් ඔවුන් ලංකාව, මියන්මාරය, තායිලන්තය, කාම්බෝජය හා ලාඕසය යන ථෙරවාදී රටවලට එරෙහිව කරන ක්‍රියාකාරකම් වෙනත් කරුණු මගින් වසාදමා ඇත. ලංකාවේ දෙමළ ජනයාට ඇති ඊනියා ප්‍රශ්නයක් ගැන ලොව දෙවනත්කරන බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියේ ජනමාධ්‍ය බංගලාදේශයේ ථෙරවාද බෞද්ධයනට එරෙහිව කෙරෙන ක්‍රියා පිළිබඳව මුනිවත රකියි.

ලිපියේ තේමාවෙන් බැහැරට යන බවක් මතුපිටින් පෙනීගිය ද මහායානය, තන්ත්‍රයානය වැනි යාන ගැන වචනයක් දෙකක් කිවයුත්තේ අද මෙරට සිංහල සංස්කෘතියට පහරදීමට මේ යාන ද යොදාගැනීමේ වෑයමක් ඇති බැවින් ය. දශක ගණනාවක් තිස්සේ, කිසි දිනක කිසිම දාර්ශනික සංකල්පයක් නිර්මානයකර නොමැති ඊනියා දාර්ශනිකයන් විශ්වවිද්‍යාලවලත් නවකතාකරුවන්, කවියන් ආදී වශයෙන් ඉන් පිටතත් බොරු මහායාන වචන හරඹයක් සිංහලයන් අතරට ගෙනයෑමේ අසාර්ථක වෑයමක් පවතියි. නිවණ හා සසර එකක් ලෙස සැලකීම වැනි දාර්ශනික යැයි පෙනෙන එහෙත් ව්‍යාජ අදහස් ඇතැමුන්ට ආකර්ෂණීය විය හැකි ය. සසර යනු සංකල්පයක් වන අතර නිවණ සංකල්පයක් නො වෙයි. සංකල්පයක් එවැන්නක් නොවන්නක් සමග ගැටගැසීම ම මූලික වරදකි. මරණය ද ජීවිතය ම වන්නේ ය වැනි කතා දාර්ශනික වල්පල් පමණකි. සිංහල ගැමියෝ ථෙරවාදයේ ආභාසයෙන් ගුණාගුණ, අඩුවැඩිය, ගැවීනොගැවී ආදී යෙදුම් භාවිතාකරති. එහෙත් ඔවුහු කිසි දිනෙක ගුණ හා අගුණ යනු එකක්මය හෝ අඩු වැඩි යනු දෙකක් නොවේයැයි හෝ නො කියති; අඩුවැඩි වශයෙන් හෝ එසේ නො කියති. විරුද්ධාර්ථ ඇති වචනවල වෙනසක් දකිමින් ම ඒ එකට යොදාගැනීම සිංහල ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදාය වෙයි. බොරු මහායානික දාර්ශනිකයන්ට වඩා සිංහල ගැමියෝ දාර්ශනිකයෝ වෙති. අඩුවැඩිය ආදිය සිංහලයන් මහායානයකින් ගත් දෑ නො වෙයි. මිලින්ද ප්‍රශ්නයෙහි න ච සො න ච අඤ්ඤො යනුවෙන් ඇත්තේ ථෙරවාදයෙහි චතුස්කෝටිකයට උදාහරණයකි. මේ කරුණු සම්බන්ධයෙන් දීර්ඝ ලිපියක්

© Prof. Nalin De Silva

ලිවිය යුතු නමුත් වාක්‍ය කිහිපයකින් හෝ ඒ සඳහන් කෙළේ සිංහල සංස්කෘතිය දුර්වලකිරීමට මහායානය යොදාගත හැකි බැවින් ය. අතීතයේ දී මහාවිහාරික භික්ෂූන්වහන්සේ භාරතයෙන් පැමිණි බමුණන්ගේ මහායානික මත පරාජයකළහ. මහායාන ආදි කර්තෘන්වහන්සේලා බ්‍රාහ්මණ කුලයෙහි ඉපදීම අරුමයක් නොවිය යුතු ය. භාරතයෙන් බුද්ධදහම අතුගෑවීයෑමට එක් හේතුවක් වුයේ නාගර්ජුනපාදයන් වහන්සේ තමන්වහන්සේගේ ශූන්‍යතාවාදය මගින් පසුව පැමිණි ශංකරාචාර්යයන්ට නිර්ගුණ් බ්‍රහ්මන් සංකල්පය නිර්මානයකිරීමට සුදුසු පරිසරයක් නොදැනුවත්ව නිර්මානයකර තිබීම ය. එදා භාරතීය බ්‍රාහ්මණයන් මහායානය යොදාගත් අන්දමට අද බටහිරයෝ ඒ යොදාගැනීමට උත්සාහකරති. අප මේ කරුණු තේරුම්ගත යුතු ය. සිංහල සංස්කෘතිය දියකර හැරීමට කටයුතුකරන්නේ සිරසක් නැති නාලිකා පවත්වාගෙන යන මහාරාජාලා පමණක් නොවේ. අප අතර සිටින ව්‍යාජ දාර්ශනිකයෝ ද වක්‍රව හෝ එහි දී යොදාගැනෙති. සංස්කෘතිය දියකර හැරීවිට ජාතියකට පරාධීනත්වය අහිමිවීම සිකුරු ය.

කොටි අද රිසිසේ මිනීමරති. රනිල් වික්‍රමසිංහගේ සටන් විරාම ගිවිසුමෙන් හමුදාව නිරායුධ කෙරී ඇත. අද හමුදාභටයන්ට ආත්මාරක්ෂාවට වුව ද ගිනි අවි යොදාගත නො හැකි ය. කොටි කීවරක් ඊනියා සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කර ඇත් ද? හමුදා භටයන් මියගිය විට ද ජාත්‍යන්තර ප්‍රජාව යැයි කියන්නන් කරන්නේ කොටි ත්‍රස්තවාදීන්ට ද හමුදාවට ද ඉවසිල්ලෙන් ක්‍රියාකරන ලෙස ඉල්ලා සිටීම ය. ඔවුහු කොටින්ට දොස් නො පවරති. ඒ අතර ආණ්ඩුව දැනට කරන්නේ ශෝක ප්‍රකාශයක් නිකුත්කිරීමත් ඝාතකයන් හෙලා දැකීමත් ය. මේ ප්‍රමාණවත් නො වේ. ආණ්ඩුව වහාම දැඩි පියවරක් ගතයුතු ය. නැතහොත් ජනතාවට මහින්ද රාජපක්ෂ මහතා රනිල් වික්‍රමසිංහ මහතාගෙන් වෙන්ව නොපෙනෙනු ඇත. මහින්ද රාජපක්ෂ මහතා තමන්ට බටහිරින් හා ඉන්දියාවෙන් කෙරෙන බලපෑම් ගැන ජනතාව දැනුවත් කළයුතු ය. එය රාජ්‍යතන්ත්‍රික නොවේයැයි පණ්ඩිතයන් කීමට ඉඩ ඇත. රාජ්‍යතන්ත්‍රිකයට එරෙහිව ඉන්දීය මහකොමසාරිස්වරිය මුණගැසීමට ඇගේ නිලනිවසට රාජපක්ෂ මහතා ගියවිට පණ්ඩිතයෝ  කිසිවක් කීවෝ ද? පණ්ඩිතයන් කට අරින්නේ ලංකාව ස්වාධීනව කටයුතුකිරීමට උත්සාහකළහොත් පමණකි.

කොටි ත්‍රස්තවාදීන් පරාජයකරන ලෙස ඉන්දියාවෙන් හෝ බටහිරයන්ගෙන් හෝ ඉල්ලා සිටීම තේරුමක් නැති දෙයකි. අද ඉන්දියාවට බටහිරයන්ගෙන් තොරව පැවැත්මක් නැත. ඉන්දියාවේ පුළුල්වන මධ්‍යම පංතියත් සමග එරට බටහිරට ගැතිවීම තවත් වැඩිවනු ඇත. බටහිරයන් අද වඩාත්ම කරදරකරන්නේ මුස්ලිම් රාජ්‍යවලටත් වඩා ථෙරවාදී බෞද්ධ රටවලට ය. මියන්මාරය හා ලංකාව ඉනුදු ප්‍රධාන වෙයි. ඉංදියාවට හෝ බටහිරට හෝ යාප්පුවීම පැත්තකට දමා අපේ උත්සාහයෙන් අපේ ම ප්‍රවාද ගොඩනගා ගැනීමට අපි උත්සාහකරමු. අපට නිදහසක් අත්කරගත හැක්කේ බටහිරයන්ගේ දැනුමෙන් අප නිදහස්වීමෙන් ය. මහින්ද රාජපක්ෂ මහතා කළයුත්තේ ඊනියා සාම සාකච්ඡා ගැන බලාපොරොත්තුවකින් කටයුතුකිරීම නො වෙයි. වහාම කොටි ත්‍රස්තවාදීන් හමුදා ක්‍රියාමාර්ගයකින් පැරදවීමට කටයුතු කළයුතු ය. හමුදාව ඇත්තේ අවශ්‍ය අවස්ථාවල දී ආයුධ පාවිච්චියට මිස කොස් කොටන්නට නො වෙයි. හමුදාවේ මානසිකත්වය දුර්වල කෙරෙන අන්දමට ඊනියා ගැටුම් නිරාකරණයකිරීම් ගැන බොරු දාර්ශනිකයන් (තමන්ට දර්ශනය හරිහැටි නොතේරෙන බැවින් දෝ මේ කසිකබල්ලු විශ්වවිද්‍යාලවල රාජ්‍ය නොවන සංවිධානවල මුදලින් ඊනියා ගැටුම් නිරාකරණය පිළිබඳ පාඨමාලා පවත්වති.) ලවා දේශන පැවැත්වීම වහාම නතර කළයුතු ය. හමුදාවට ගරහා ප්‍රංශයන්ගේ හා වෙනත් බටහිරයන්ගේ මුදලින් ප්‍රංශ තෑගි සඳහා නිපදවා ඇති සුළඟ එනු පිණිස වැනි තුට්ටු දෙකේ චිත්‍රපටි නිශ්පාදනය කළවුන්ට ජනාධිපති සම්මාන දුන් රටක නායකයන්ට අදීනත්වයක් තිබිය හැකි නො වෙයි. මේ චිත්‍රපටියෙහි සුළඟ එනු පිණිස කරන්නේ ඇඳිවත උනාදැමීම ය. සුළඟ ආ යුත්තේ එක අවයවයකට පමණක් යැයි බොරු පණ්ඩිතමානී ගැටයා කුළුඳුලේ ම  සිතන්නට ඇත. රාජපක්ෂ මහතා වහාම චන්ද්‍රිකා ප්‍රතිපත්තිවලින් ඉවත්විය යුතු ය. හමුදාවේ ආත්මාභිමානය වැඩිකරන ක්‍රියාකාරකම්වල භටයන් නිරතකළ යුතු ය. හරිහැටි කරන්නේ නම් සති දෙකක් ඇතුළත කොටි සුන්නත්දූලි කර දැමිය හැකි බව දන්නෝ දනිති. සති අන්ත පත්තර කඩමාළුවල හා වෙනත් තැන්වල ඉන්නා බොරු පණ්ඩිතයන් එසේ කළ නොහැකි යැයි පවසන්නේ බටහිරයන්ගේ මුදලට හා මතවාදවලට යටවීමෙන් ය. වඩමාරච්චියේ දී අවසන් කළ හැකිව තිබුවක් අද දික්ගැස්සෙන්නේ ඉන්දියාවේ බලපුළුවන්කාරකමට යටවීම හේතුවෙන් ය.  ඉන්දියාවට හෝ බටහිරට හෝ අපි යටත් නො වෙමු. නායකයන් පරිත්‍යාගශීලී වන්නේ නම් කැපවන්නේ නම් ජනතාව ද එසේ කරනු ඇත. ජනතාවට බලපෑම් පිළිබඳ ඇත්ත කියා කොටි නැතිකර දැමීමට පියවර ගතයුතු ය.

© Prof. Nalin De Silva